# ලංකා සමාජයේ කේන්ද්‍රීය සාරධර්ම පද්ධතිය නිර්මාණය කිරීමෙහි ලා ''සද්ධර්මාලංකාරයෙන්'' සිදු වූ කාර්යභාරය හා වර්තමාන ස්වරූපය පිළිබඳව සොයා බැලීමක්

මහාචාර්ය අලහේනේගම සුමනරතන හිමි[1]

## හැඳින්වීම

මනුෂ්‍යයන් පිරිසකගේ එකතු වීමෙන් සමාජයක් බිහි වෙයි. මෙසේ වූ සමාජයේ එකිනෙකා අතර අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩ නැගීම තුළින් පොදු එකඟතාවක් ගොඩ නැගෙයි. ඔවුනොවුන්ගේ එම එකඟතාවේ සිතිවිලි මත සම්ප්‍රදායයන්, සම්මුති, නීතිරීති වැනි අංශ නිර්මාණය වෙයි.

සාරධර්ම ද ඔවුනොවුන්ගේ යහපත් වූ සිතිවිලි මත ගොඩ නැගෙයි. ඒ තුළින් සමාජ බන්ධනය, ගුණධර්ම ආදි ලක්ෂණ නිර්මාණය වී සංවර්ධනය වෙයි. සාරධර්ම පිළිබඳව විග්‍රහයක යෙදෙන විද්වත් ඒ. එස්. බාලසූරිය මහතා සාරධර්ම යනු පුද්ගලයා, සමාජය හා ජීවිතය සාරවත් කරන, පෝසත් කරන හා අර්ථවත් කරන මානුෂික ගුණයක් බව සඳහන් කරයි. තවද ''සාරවත් කරන්නේ යමක්ද එය සාරධර්මයි.'' යනුවෙන් වැඩිදුරටත් අර්ථ දක්වයි. එක් සමාජ පරම්පරාවක් සතු සාම්ප්‍රදායික අගයයන් ඊළඟ පරම්පරාවට පමුණුවාලීම සාරධර්ම අධ්‍යාපනයෙන් සිදු කෙරෙන බව බාලසූරිය මහතා විසින් රචිත ''සාරධර්ම අධ්‍යාපනය'' නැමැති ග්‍රන්ථයෙන් ද පෙන්වා දෙයි.

සාරධර්ම යැයි සැලකිය හැකි වන්නේ කිසියම් වස්තුවක් හෝ සිද්ධියක් පුද්ගලයෙකු කෙරේ බලපාන ආකාරය හෝ අර්ථවත් බව ලෙස ඉකෙදා දයිසකු මහතා පෙන්වා දෙයි. සාරධර්ම හටගන්නේ ඇගයීමේ යෙදෙන තැනැත්තාත් ඇගයුමට පාත්‍ර වන වස්තුවත් අතර පවත්නා හේතුවෙන් බවද ඔහු ප්‍රකාශ කරයි.

මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට බුදුදහම වැඩම වීමෙන් පසුව බෞද්ධ සංස්කෘතියේ ද බලපෑමෙන් ඔවුනොවුන්ට ගරුකරමින්, ගුණවත්කම් ප්‍රදර්ශනය කිරීමේ උසස් ධර්මතා විවිධ ක්‍රම මගින් දිවයින පුරා ප්‍රචලිත වන්නට විය.

## ක්‍රමවේදය

විවිධ ආකාරයෙන් ලංකා සමාජය වෙත කේන්ද්‍රගත වූ, මිනිසා ගුණ දහමින් බැඳ තබන්නා වූ සාරධර්ම පද්ධතිය ප්‍රායෝගික ක්‍රියාකාරී ක්‍රම මගින්ද, ත්‍රිපිටකාගත ග්‍රන්ථ හා තදනුබද්ධව රචනා වූ ග්‍රන්ථ මගින් ද මිනිස් හදවත් තුළට ප්‍රවිෂ්ට විය. අප විසින් මෙහිදි පාලි රසවාහිනී නම් ග්‍රන්ථය පාදක කොට නිර්මාණය වූ සිංහල ''සද්ධර්මාලංකාරය'' නම් කෘතිය තුළින් පෙන්වා දෙන සාරධර්ම පිළිබඳව

---

[1] භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කරනු ලබයි. ඒ තුළින් නූතන සාරධර්ම ගමන් මග පිළිබඳව ද යමක් සොයා බැලෙයි.

**සාකච්ඡාව**

සද්ධර්මාලංකාරය රචනා වී ඇත්තේ ගම්පොළ සාහිත්‍ය යුගයේ ජයබාහු ධර්මකීර්ති නම් හිමි නමකගේ කර්තෘත්වයෙනි. රසවාහිනී ග්‍රන්ථයෙහි අන්තර්ගත වූවාක් මෙන්ම සද්ධර්මාලංකාරයේ දඹදිව නිර්මාණය වූ කථා කොටසක් ද ලංකාවේ ජාත වූ කථා වස්තු කොටසක් ද පෙනෙයි. එයින් සෑම කථාවස්තුවකින් ම පාහේ සාරධර්ම පාර්ශවයට සුවිශේෂී ස්ථානයක් හිමි කර දී තිබේ. එයින් කථාවස්තු සුළු කොටසකින් පමණක් ප්‍රකාශ වෙන්නා වූ සාරධර්ම කීපයක ලක්ෂණ අවධානයට ලක් කෙරෙයි.

තුන්යහළු කථාවස්තුවට අනුව බරණැස් නුවර වනාන්තරයක පැවති හැටරියන් ගැඹුරැති නරාවළකට වැටී සිටි ගිරාපෝතකය, නාගරාජයක, මනුෂ්‍යයක යි තිදෙනෙකු එහි ගිය සත්පුරුෂ මිනිසෙක් ගොඩ ගත්තේය. අනතුරුව උපකාරයක් අවශ්‍ය විටක දන්වන ලෙස ද ඔවුහු සත්පුරුෂ මිනිසාට කීහ. දුප්පත් සත්පුරුෂයා ගිරවාගෙන් උපකාරයක් ඉල්ලා එරට රජුගේ මුතුහර ලැබ ගෙන එය පරෙස්සමට අනෙක් පුරුෂයා ළඟ තැබීය. ඔහු එය රජතුමාට අල්වා දුන්නේය. අකෘතඥ පුරුෂයා නිසා මරණ වධයට රාජ අණින් නියම වූ සත්පුරුෂයා සිදු වූ විපත නාගරාජයාට ද දැන්වීය. නාගයා වහා අවුත් රජ බිසවට දෂ්ට කොට දංගෙඩියට ගෙනයන මිනිසා ලවා වෙදකම් කරවා රජුගෙන් ධනය ලබා දීමට ක්‍රියා කරවීය.

මෙම කථාවෙන් ප්‍රකාශවෙන සාරධර්ම එදා සමාජය සාර්ථක කරගැනීමට අතිශයින් ම ප්‍රයෝජනවත් විය. වර්තමානයේ ද තිරිසනුන් ළඟ පවා ඇති උතුම් ගුණධර්ම මිනිසුන් තුළින් ගිලිහී ගොස් ඇති ආකාරය මෙම තුන්යහළු කථාවෙන් මැනිවින් පෙනෙයි. නූතන ශ්‍රී ලංකාවේ ඇතැම් මිනිසුන්ගෙන් ඇත් වී පවතින සාරධර්ම යළි ඇතිකරලීම සඳහා සද්ධර්මාලංකාරය කෙතරම් වටින්නේදැයි සිතා බැලීම වටනේය.

එලක වස්තුවේ සඳහන් පරිදි සැවැත්නුවර උතුරු මාර්ගයට යාමට සූදානම් වූ මිනිසෙක් විඩාවට පත් වී පුවරුකඩක් උඩ සිට බුලත් සපමින් සිටියේය. එසේම උතුරු මගින් ආ මිනිසෙක් පිපාසිතව අර මිනිසාගෙන් මිලදී බුලත් ගෙන සපා ගමන නිම කළේය. පසු කලෙක බුලත් විකුණූ මිනිසා වෙළඳාමේ ගොස් මහමූදේ අතරමං වී පීනන්නට පටන් ගත්තේය. අනෙක් පුරුෂයා ද එසේම අතරමංවී පුවරුකඩක් ගෙන පීනන අතර අර මිනිසා හමු වී තමාට බුලත් දී කළ උපකාරය සලකා පුවරුකඩ දී පළමු පුරුෂයා ගොඩට යැවීය. මූදේ මියයාමට සිටි සත්පුරුෂයාට ඔහුගේ ගුණය සලකා ගොඩ ඒමට දේවතාවියක් උපකාර කළාය. අනුන්ට උපකාර කිරීමෙන් දැක් වූ සාරධර්ම පිළිබඳව ලංකාවාසී ජනයාට උගන්වා ඇති පාඩම කෙතරම් වටනේදැයි මෙයින් පැහැදිලි වෙයි.

සද්ධර්මාලංකාරයේ පානීය නම් කථාවස්තුවෙහි එක් ගැබ්බර මවක් ගමකට යාම සඳහා චන්‍ද්‍රභාගා නම් තොටින් නැව් නැග්ගාය. ඇය දරු ප්‍රසූති වේදනාවෙන් කෑගසද්දීත් ඈ ඉල්ලූ වතුර දීමට එහි ගමන් කළ මිනිස්සු ඉදිරිපත් නොවූහ. මේ අතර එහි ගමන් කළ සත්පුරුෂයෙක් ජලය ලබා දී උපකාර කළේය. පසු කලෙක ඈ සිටි නුවරට ගිය සත්පුරුෂයා අතරමංවී රාත්‍රී අම්බලම් ශාලාවක සිටියේය. මේ අතර රජුගේ මාලිගය බිඳගෙන යන සොරු වස්තුව ශාලාවේ දමා ගිය අතර අර අසරණ මිනිසා රාජ අණින් මරණයට නියම විය. කළගුණ දත් කලින් උපකාර ලැබූ ස්ත්‍රිය ඔහුව හැඳිනගෙන රජතුමාට අපමණ ඇවිටිලි කොට ඔහුව නිදහස් කරගෙන රජුගෙන් ඔහු සමග ධන ධාන්‍ය පවා ලැබුවාය. මේ ආකාරයෙන් ලබා දෙන උතුම් ගුණධර්ම ඈත කාලයේ මෙන්ම නූතන ලංකාවේ බුදුදහම නංවාලීමටත් උපකාර නොවන්නේදැයි තම තමන්ගෙන් ම විමසා බැලිය යුතුය.

සංසදත්ත නම් කථාවස්තුවෙහි මෙසේ එයි. ලංකාවේ අනුරාධපුර සමයෙහි බැමිණිටියාසාය නම් නියං සායක් ඇති වූයෙන් ගමක සිටි සොයුරු 7 දෙනා සොයුරියද රැගෙන ඈත ගමකට යාමට තීරණය කළහ. නියගෙන් මිරිකී එගම වසන හිමිනමක් ද වැඩමා ගෙන යන ලෙස සොයුරිය සොයුරනට ආයාචනා කළාය. අලුත් ප්‍රදේශයෙන් සොයුරන් මගින් දුකසේ ලත් වස්ත්‍ර ද තමා අමාරුවෙන් ඇඳි වතෙන්ම පිරිමසා ගෙන තෙරුන්ට පුදා ආහාර පානාදියෙන් කළ උපස්ථානයෙන් එම ස්ත්‍රිය බොහෝ සම්පත් ලද්දීය.

මෙයින් ලබා දෙන යහපත් සාරධර්ම ලක්ෂණ කොයි කාලයට වුවද සෑහෙයි.

සරණ ස්ථවිර වස්තුව (113පිට), රූපදේවි වස්තුව (277), දුෂ්ටගාමිණී වස්තුව (428) ආදී කථා වස්තුන්ගෙන්ද සාරධර්ම පිරි සමාජයකට ලැබෙන අනු බල බොහෝය.

**ප්‍රතිඵලය සහ නිගමනය**

වර්තමාන සමාජයේ ඇතමුන් පෙර පැවති සමාජය දෙස බලන විට සාරධර්ම අතින් තිරිසනුන්ටත් වඩා ගිලිහී හමාර බැව් පෙනේ. සද්ධර්මාලංකාරයේ එන තුන්යහළු වස්තුව හැදෑරීමෙන් උසස් ගුණධර්ම නැවතත් සමාජයට කියාදීම තුළින් ශ්‍රී ලංකාවේ සාරධර්මවලින් පරිපූර්ණ සමාජයක් ගොඩනැගිය හැකි බව අවධාරණය කළ යුතුය.

එලක වස්තුවේ සඳහන් පරිදි දුකට පත් මිනිසෙකු විසින් තමා ද දුකෙන් පෙළෙමින් ජීවිත පරිත්‍යාගයෙන් කළ මිනිස් ගුණධර්ම පිරි උපකාරය මුළු මහත් මිනිස් සංහතියටම ලබා දෙන ආදර්ශයකි. මෙම කෘතියේ මෙවන් කථා පාඨකයාට අවධාරණය කිරීම තුළින් ඔවුන්ගේ පරෝපකාර සංවේදනීය ආකල්ප බොහෝ දුරට සංවර්ධනය කළ හැකි නොවේද?

පානීය නම් කථා වස්තුවේ නන්නාදුන පුරුෂයෙක් විලිපහරන, මරණාසන්න කාන්තාවකට කළ උපකාරය නිසා ඔහුට මහා රාජ උපකාර පවා ලැබුණි. එම දුක්බර කාන්තාව පමණක් නොව දුකට පත් ඕනෑම කෙනෙකුට

කැපවීමෙන් කරන උපකාර තුළින් බුදුදහමේ ප්‍රකාශිත සාරධර්ම තුළින් ලංකා බුදුදහම ඉදිරියට ගෙන යා හැකි නො අනුමානය. සද්ධර්මාලංකාරය වැනි කෘති තුළ ඇති මෙවන් සාරධර්ම මහජන හදවත් තුළට කිඳා බැස්සවීමෙන් ශ්‍රී ලාංකීය බුදුදහම ද නංවාලිය හැකි බැව් අමුතුවෙන් කිවයුතුද?

**ප්‍රමුඛ පද :** සාර ධර්ම, සමාජය, සද්ධර්මාලංකාරය, කථා වස්තු, කෘතඥතාව

**ආශ්‍රිත ග්‍රන්ථ**

බාලසූරිය, ඒ.එස්. (1999). *සාර ධර්ම ඉගැන්වීමේ නව ක්‍රම.* මහරගම.

දයිසකු, (2005). සාර ධර්ම අධ්‍යාපනය. අනුවාදකः එඩ්වින් ආරියදාස, වත්තල, බෞද්ධ සංගමය.

බාලසූරිය, ඒ.එස්. (2000). සාර ධර්ම අධ්‍යාපනය. තෙවන මුද්‍රණය, කොළඹ: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

සද්ධර්මාලංකාරය. (2000). ප්‍රාචීන භාෂෝපකාර සමාගම. කොළඹ: සමයවර්ධන මුද්‍රණය.